වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP
වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education NWP

23 S I

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

Third Term Test - Grade 13 - 2018

2988

විභාග අංකය ..............................

# දේශපාලන විද්‍යාව I

කාලය පැය දෙකයි

- 1 සිට 50 දක්වා එක් එක් ප්‍රශ්නයට (1,2,3,4,5) යන පිළිතුරු වලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර තෝරාගෙන ලකුණු කරන්න.
- එක් පිළිතුරකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.

❖ ප්‍රශ්න අංක 01 සිට 15 දක්වා ඇති ප්‍රශ්න සඳහා සපයා ඇති ප්‍රකාශ පහෙන් හතරක් පමණක් නිවැරදි වේ. නිවැරදි ප්‍රකාශ අයත් කාණ්ඩය තෝරන්න.

01. දේශපාලන විද්‍යාව
A මිනිසාගේ දේශපාලන චර්යාව අධ්‍යයනය කරයි.
B අනෙකුත් සමාජ විද්‍යා විෂයයන් සමඟ සමීප සබඳතාවක් දක්වයි.
C මූලික සංකල්ප සමඟ පොදු එකඟතාවක් දක්වයි.
D සාධක පාලනය කරමින් පර්යේෂණය නොකරයි.
E ශුද්ධ විද්‍යාත්මක ශිල්ප ක්‍රම භාවිතා නොකරයි.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

02. දේශපාලනය
A ආණ්ඩුවේ ප්‍රායෝගික ක්‍රියාකාරීත්වයයි.
B බලය හා සම්බන්ධ තරඟකාරී ක්‍රියාවලියයි.
C ප්‍රජාතන්ත්‍රවාදීව හෝ වෙනත් ඕනෑම අයුරකින් ක්‍රියාත්මක වන බල අරගලයයි.
D මානවයා දිගු කාලයක් ගොඩනැගූ න්‍යාය හා දර්ශනයන්ගේ එකතුවයි.
E ආණ්ඩුවක් ලෙස සංවිධානාත්මකව බලය ක්‍රියාත්මක කිරීමේ කලාවයි.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

03. දේශපාලන විද්‍යාව සමාජ විද්‍යාවක් ලෙස සැලකෙන්නේ,
A එය විද්‍යාගාර පර්යේෂණයන්හි ප්‍රතිඵලයක් නිසාය.
B එය පුද්ගල චර්යාව අධ්‍යයනය කරන්නක් වීම නිසාය.
C එය ගතික විෂයයක් ලෙස පිළිගැනෙන නිසාය.
D විෂය ක්ෂේත්‍රය කලානුරූපව වෙනස්වීම් වලට බඳුන්වන නිසාය.
E අනෙකුත් සමාජ විද්‍යාවන් සමඟ දක්වන සමීප සබඳතාවය නිසාය.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

04. රාජ්‍යය
A දේශපාලන විද්‍යාවේ කේන්ද්‍රීය සාධකය වේ.
B බලය සඳහා විධිමත්ව සංවිධානය වූ මිනිස් සමාජයක දක්නට ලැබේ.
C මිහිපිට බිහිවූ උත්තරීතර හා පාරිශුද්ධ ආයතනය බව සියලු දේශපාලන න්‍යායයන් පිළිගනී.
D බිහිවූයේ කවදාද ඒ වූ අයුරින්ම අදද දැකිය නොහැකි බව පිළිගැනේ.
E ප්‍රජා පීඩන උපකරණයන් ලෙස සමාජ සම්මුතිවාදීන් නොදකිති.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE



www.artsapi.lk
Scanned by CamScanner

05. ජාතික රාජ්‍ය බිහිවීම සඳහා
A මුදල් සංසරණ ආර්ථික රටාව බිහිවීම හේතුවක් විය.
B අතීත් කළ දේ වෙනුවට යන්ත්‍ර සූත්‍ර යොදා ගැනීමේ පෙරළිය සිදුවීම හේතුවක් විය.
C වැඩවසම් ක්‍රමයේ අභාවය බලපෑවේය.
D එක් ජාතියකට එක් රාජ්‍යයක් යන සංකල්පය බලපෑවේය.
E පාප් අධිරාජ්‍යයේ වර්ධනය ක්‍රමානුකූල පසුබිමක් සපයන ලදී.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

06. ආණ්ඩුව
A රාජ්‍යයේ ස්වාමියා ලෙස ක්‍රියාත්මකයි.
B දෘශ්‍යමාන බලවේගයක් ද වෙයි.
C පූර්ණ මිනිසා බිහිකිරීමේ රාජ්‍ය අරමුණ ක්‍රියාත්මක කරයි.
D රාජ්‍යයේ සියලු සාමාජිකයන්ගෙන් යුක්ත නොවෙයි.
E රාජ්‍ය සතු ස්වාධිපති බලය ක්‍රියාවට නංවයි.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

07. නව රාජ්‍ය සංකල්පයට අදාල රාජ්‍යයන් වන්නේ,
A දෙවන ලෝක යුද්ධයෙන් පසුව නිදහස ලැබූ රාජයයන් ය.
B ආර්ථික වශයෙන් අසංවර්ධිත රාජ්‍යයන්ය.
C සමස්ථ දේශපාලන රටාව නවීකරණය වී නැති රාජ්‍යයන්ය.
D ජාති වර්ග ආගම් ආදී ලෙස සමාජය බෙදී සිටී රාජ්‍යයන්ය.
E නැගෙනහිර කඳවුරේ රාජ්‍යයන්ය.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

08. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක මූලිකාංගවලට අදාල වන්නේ,
A ව්‍යවස්ථානුකූලවාදය
B නිදහස් හා සාධාරණ මැතිවරණ
C විධායකය විසින් නීතිය හැසිරවීම.
D බහු පක්ෂ ක්‍රමය
E නිදහස් ජනමාධ්‍ය
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

09. කැබිනට් ආණ්ඩු ක්‍රමයක නාමික විධායකය
A බොහෝවිට අගමැතිගේ කැමැත්ත මත පත්වේ.
B දේශපාලන පක්ෂයක් නියෝජනය නොකරයි.
C ඍජු මහජන නියෝජිතයෙක් නොවේ.
D ව්‍යවස්ථාදායකය තුළ දෝෂාභියෝගයක් සම්මත කිරීමෙන් පමණක් ඉවත්කළ හැක.
E අගමැති ඇතුළු කැබිනට් මණ්ඩලය ඔහුගේ නාමයෙන් විධායක කටයුතු මෙහෙයවයි.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

10. ඒකීය ආණ්ඩු ක්‍රමයක
A තනි මධ්‍යම ආණ්ඩුවක් බලය භුක්තිවිඳී
B එකම රටතුළ ද්විත්ව පුරවැසි බවක් නැත.
C ආණ්ඩුවේ බලය ප්‍රාදේශීකව බෙදා නැත.
D ප්‍රාදේශික ව්‍යවස්ථාදායකයයන්ගෙන් නියෝජිතයන් මධ්‍යම ව්‍යවස්ථාදායකයට තෝරා ගනී.
E ස්වාධිපති බලය බෙදී නැත.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

11. සන්ධීය ආණ්ඩු ක්‍රමයක,
A ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඇත.
B ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනම්‍ය වේ.
C ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලතල පංගුකර නැත.
D බහුවිධතාවය සහිත රටකට වඩාත් ප්‍රයෝජනවත් වේ.
E ද්වි මාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් දැකිය හැක.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE



www.artsapi.lk

Scanned by CamScanner

12. සමානුපාතික නියෝජන ක්‍රමය

A බහුවිධ සමාජයකට වඩාත් ඵලදායි වේ.
B ඡන්ද අපතේ යාම හීන වේ.
C සංකීර්ණ බවින් වඩාත් වැඩිය.
D සැමට නියෝජනයක් යන සංකල්පයට ප්‍රායෝගික වටිනාකමක් ලබාදෙයි.
E ඒකාධිපති ආණ්ඩුවකට මග සාදයි.

1. ABCD  2. BCDE  3. ABDE  4. ACDE  5.ABCE

13. සරල බහුතර නියෝජනය

A පළමුව දිනුම් කණුව පසුකරන්නා ජයග්‍රාහකයා කරයි.
B හැම ඡන්දයකටම වටිනාකමක් ලබාදෙයි.
C ඡන්ද ගණනය කිරීම ඉතා පහසුය.
D ඡන්ද දායකයාට වගකියන නියෝජිතයෙකු බිහි කරයි.
E පක්ෂ ප්‍රතිපත්තිසේම පුද්ගල ජනප්‍රිය බවටද ඉඩ ලබාදෙයි.

1. ABCD  2. BCDE  3. ABDE  4. ACDE  5.ABCE

14. ධනවාදී ආණ්ඩුක්‍රමයක මූලික ලක්ෂණයන් වන්නේ,

A පෞද්ගලික දේපල ක්‍රමයයි.
B ඉල්ලුම සැපයුම මත මිල තීරණය වීමයි.
C රජය ව්‍යවසාය කටයුතු වලින් ඉවත් වීමයි.
D ආර්ථිකය පාලනය කිරීමෙන් රජය මුළුමනින්ම ඉවත් වීමයි.
E නිදහස් ව්‍යවසායකත්වය පිළිගැනීමයි.

1. ABCD  2. BCDE  3. ABDE  4. ACDE  5.ABCE

15. සමාජවාදී ආණ්ඩු ක්‍රමයක,

A පොදු දේපල ක්‍රමය පිළිගනී.
B තනි දේශපාලන පක්ෂයක් ක්‍රියාත්මක වේ.
C වෙළඳපොල බලවේග ක්‍රියාත්මක නොවේ.
D දේපල ඉපයීමේ නිදහස සීමාවේ.
E ජනමාධ්‍ය මුළුමනින්ම නිදහස්ය.

1. ABCD  2. BCDE  3. ABDE  4. ACDE  5.ABCE

❖ **16 සිට 25 දක්වා ප්‍රශ්න සඳහා ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාවට අදාලව ප්‍රකාශ පහක් ලබාදී ඇත. ඉන් එක ප්‍රකාශයක් සාවද්‍ය වේ. එම සාවද්‍ය ප්‍රකාශය තොරන්න.**

16. දේවවරම්වාදයට අනුව,

1. රාජ්‍ය නිර්මාණය කර ඇත්තේ දෙවියන් විසිනි.
2. පාලකයා දෙවියන් වහන්සේට වග කිව යුතුය.
3. රාජ්‍ය පවතින්නේ දෙවියන් වහන්සේගේ කැමැත්ත ඇති තාක් පමණි.
4. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක් නිර්මාණය වීමට මග පාදයි.
5. ලෞකික සහ ලෝකෝත්තර සියල්ලේ පදනම දේව නීතියයි.

17. සමාජ සම්මුතිවාදී න්‍යාය,

1. රාජ්‍ය සමාජයේ එකඟතාවය මත බිහිවූවක් බව කියයි.
2. හොබ්ස්, ලොක්, රූසෝ යන චින්තනයන් තිදෙනාගේ මුල්වීමෙන් බිහි විය.
3. ඒක පාර්ශ්වික මෙන්ම ද්වි පාර්ශවික සම්මුතින් පිළිබඳ කරුණු දන්වයි.
4. ජෝන් ලොක්ට අනුව දේපල යනු මිනිස් ශ්‍රමය ස්වාභාවික සම්පත් සමඟ මිශ්‍ර කිරීමේ ප්‍රතිඵලයයි.
5. වඩාත්ම ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සහ පාලකයා පිළිබඳව හොබ්ස් කථා කරයි.

18. රාජ්‍ය පිළිබඳ විකාශනාත්මක වාදය,

1. රාජ්‍යයේ දිගුකාලීන විකාශය පිළිබඳ කරුණු දක්වයි.
2. මිනිසුන් එකට එක්වීම රාජ්‍යයේ ආරම්භය ලෙස පැහැදිලි කරයි.
3. රාජ්‍ය සදාකාලික ආයතනයක් නොවන බව කියයි.
4. සමාජ බන්ධන මිනිසුන් එකට එක්වීම සඳහා බලපෑ ප්‍රධාන සාධකය ලෙස හඳුන්වයි.
5. රාජ්‍ය ගෝත්‍ර රාජ්‍යයෙන් ආරම්භ වී ජාතික රාජ්‍ය දක්වා ගමන් කර ඇතැයි සඳහන් කරයි.

19. රාජ්‍ය, සමාජවාදීන්ට අනුව,

1. තෘප්තිමත් සහ ප්‍රීතිමත් මිනිසා නිර්මානය කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වෙයි.
2. පංති භේදය පවත්නාතාක් රාජ්‍ය පවතී.
3. ප්‍රජා පීඩක උපකරණය කි.
4. උත්තරීතර කොමියුනිස්ට් සමාජය අවධිය දක්වා සමාජ අවධීන් හයක් ගැන අදහස් දක්වයි.
5. අනාගත උත්තරීතර කොමියුනිස්ට් සමාජ අවධියේදී රාජ්‍ය වියළී යන බව ප්‍රකාශ කරයි.



www.artsapi.lk

Scanned by CamScanner

20. යහපාලනය සඳහා අවශ්‍ය මූලික කොන්දේසි වනුයේ,
1. අධිකරණයේ ස්වාධීනත්වයයි
2. තරගකාරී පක්ෂ ක්‍රමයයි
3. පාලනය වූ ජනමාධ්‍යයක් පැවතීමයි.
4. ආණ්ඩුවේ විනිවිද භාවයයි.
5. නිදහස් හා සාධාරණ මැතිවරණ නිසිකලට පැවැත්වීමයි.

21. දේශපාලන පක්ෂයක කාර්යයන් වන්නේ,
1. ජනතාව දැනුවත් කිරීමයි.
2. විසිරීගිය මහජන මතය එක් මතයක් ලෙසට ගෙන ඒමයි.
3. නිවැරදි දේශපාලන සමාජානුයෝජනයක් ඇති කිරීමයි.
4. බලය ලබා ගැනීමේ අරමුණින් පමණක් ක්‍රියාත්මක වීමයි.
5. නායකයන් බිහි කිරීම සහ පුහුණු කිරීමයි.

22. සිවිල් සමාජයක පොදු ලක්ෂණ වන්නේ,
1. ආණ්ඩුව, වෙළඳපොළ, පවුල ප්‍රධාන වශයෙන් ඇතුලත් වීම.
2. දේශ සීමා නිශ්චිත ලෙස හඳුනා ගත නොහැකි වීම.
3. බලය යෙදීමෙන් තොරවීම.
4. සාමුහික ක්‍රියාවන්ගෙන් සමන්විත වීම.
5. ජනතාව දේශපාලන වශයෙන් බල ගැන්වීම් කිරීම.

23. මූලික අයිතිවාසිකම්,
1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකින් සහතික කළ ඒවා වේ.
2. යුතුකම් සහ නිදහස සමඟ සෘජුව සම්බන්ධ වේ.
3. නීතිමය වැදගත්කමින් තොරවේ.
4. බොහෝ විට ශ්‍රේෂ්ඨාධිකරණයන් විසින් ආරක්ෂාකර දේ.
5. මානව අයිතිවාසිකම් වලින් අදාල රටට අවශ්‍ය ලෙස උපුටා මූලික නීතියට ඇතුලත් කළ ඒවාවේ.

24. අමරිකානු විධායකය පාලනය කිරීම සඳහා පනවා ඇති විධිවිධානයන් වන්නේ,
1. ජනපතිගේ වාර්ෂික අයවැය ලේඛනය නියෝජිත මන්ත්‍රී මණ්ඩලයෙන් අනුමත විය යුතු වීම.
2. බොහෝ තනතුරු ජනපතිවරයා පත්කළත් අනුමත කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට බලය සෙනෙට් මණ්ඩලයට ලබා දීම.
3. දෝෂාභියෝග යෝජනාවක් විභාගකොට ජනපති ඉවත් කිරීමේ බලය සෙනෙට් මණ්ඩලය සතු වීම.
4. ජනපතිවරයාට විදේශ ගිවිසුම් සඳහා අනුමැතිය සෙනෙට් සභාවේ තුනෙන් දෙකක බහුතරයකින් ලබාගත යුතු වීම.
5. ඕනෑම අවස්ථාවක කිසියම් වරදක් හේතුවෙන් ජනපති ඉවත්කිරීමේ බලය ශ්‍රේෂ්ඨාධිකරණය සතුවීම.

25. ප්‍රංශ ආණ්ඩුක්‍රමය,
1. ජනපති සහ අගමැති ප්‍රමුඛ දෙමුහුන් ආණ්ඩු ක්‍රමයකි.
2. අගමැතිවරයා ජනාධිපති විසින් පත් කරන ආණ්ඩු ක්‍රමයකි.
3. අමාත්‍ය මණ්ඩලය ජනාධිපති විසින් පත් කරන ආණ්ඩු ක්‍රමයකි.
4. පාර්ලිමේන්තුවට බැහැරින් කිසිවෙකු අමාත්‍ය මණ්ඩලයට පත් කළ නොහැකි ආණ්ඩුක්‍රමයකි.
5. පාර්ලිමේන්තු අනුමැතියට ඉදිරිපත්වන ආඥා කෙටුම්පත් සඳහා අනිවාර්ය අනුමැතිය ජනාපතිගේ අත්සනින් ලැබිය යුතු ආණ්ඩුක්‍රමයකි.

❖ **අංක 26 සිට 35 තෙක් ප්‍රශ්න සඳහා ඒ ඒ මාතෘකාවට හා සම්බන්ධ ප්‍රකාශ පහක් ඉදිරිපත් කොට ඇත. ඒවායින් නිවැරදි වන්නේ ප්‍රකාශ හතරක් පමණි. නිවැරදි ප්‍රකාශ අන්තර්ගත කාණ්ඩය තෝරන්න.**

26. 1833 කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණය මගින් සිදුකළ යෝජනා නිසා මෙරට ඇති වූ වෙනස්කම් වන්නේ,
A නව ව්‍යාපාරික පංතියක් බිහිවීම.
B දේශීය අධ්‍යාපනය පුළුල් වීම.
C වෙළඳපොළ ආර්ථිකයක් නිර්මාණය වීම.
D ඒකීය අධිකරණයක් සඳහා මාවත විවෘත වීම.
E පාලනය ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් කරා ක්‍රමිකව ගමන් කිරීමේ පදනම ගොඩනැගීම.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

27. කෲව් මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය
A ප්‍රථම වරට සීමිත ඡන්ද බලය හඳුන්වාදුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය විය.
B ව්‍යවස්ථාදායක සභාවේ මුළු මන්ත්‍රීන් සංඛ්‍යාව 21 දක්වා වර්ධනය වීමක් දැකිය හැකිවිය.
C නිලලත් මන්ත්‍රීවරුන්ගේ බහුතර ආධිපත්‍ය එසේම ආරක්ෂා කරන ලද ආණ්ඩු ක්‍රමයක් විය.
D ලාංකිකයන් වෙනුවනේ ඡන්දයෙන් මන්ත්‍රීවරුන් තිදෙනෙක් පත්කිරීමට දායක විය.
E ආණ්ඩුකාරවරයාගේ බලතල එසේම ආරක්ෂා කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් විය.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

www.artsapi.lk



Scanned by CamScanner

28. 1924 මැනිං ඩොවොන්ෂයර් ආණ්ඩුක්‍රමය
A වගකීමෙන් බලය විසන්ධිකල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිර්මාණය කළේය.
B විධායක කටයුතුවල අවසාන බලය හා වගකීම ආණ්ඩුකරුට හිමිකර දුන්නේය.
C ව්‍යවස්ථාදායක සභාවේ මුළු සාමාජික සංඛ්‍යාව 49 දක්වා වර්ධනය කිරීමට දායකවිය.
D නිල නොලත් පිරිසේ බලය ඉතාමත් ඉහළ මට්ටමකට ගෙන ආ ආණ්ඩුක්‍රමයක් ලෙස ක්‍රියාත්මක වේ.
E අයවැය හා මූල්‍ය යෝජනා ආරම්භ කිරීමේ බලය ව්‍යවස්ථාදායක සභාවට පවරා දුන් ආණ්ඩු ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක විය.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

29. මෙරට ජාතික ව්‍යාපාරය
A ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයක් පමණක් විය.
B ශක්තිමත් හෝ ඒකාබද්ධ ව්‍යාපාරයක් නොවීය.
C ඉතාමත් සාමකාමී ව්‍යාපාරයක් විය.
D අභ්‍යන්තර ස්වයං පාලනය දිනාගැනීම මූලික අරමුණක් බවට පත්විය.
E සියලු ජනයා සම්බන්ධ වූ ව්‍යාපාරයක් විය.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

30. ශ්‍රී ලංකාවේ වාමාංශික ව්‍යාපාරය සම්බන්ධයෙන් අදාල ප්‍රකාශය වන්නේ,
A නිදහස දිනාගැනීම මූලික අරමුණින ක්‍රියාත්මක වීමයි. B පීඩිත ජනතාව අතර වේගයෙන් ප්‍රචලිත වීමයි.
C වඩාත් රැඩිකල්වාදීව ක්‍රියාත්මක වීමයි. D කම්කරු පංතියෙන් වියෝවීමයි.
E අනාගත සමාජවාදී සමාජයක් බිහි කිරීමට තැබූ පියවරක් ලෙස දිස්වීමයි.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

31. 1931 සර්වජන ඡන්ද බලය ලැබීමෙන් මෙරට ඇති වූ වෙනස්කම් වූයේ,
A සමාජවාදී රටාවකට ලංකාව ගමන් කිරීමයි. B සුබ සාධක රාජ්‍යයක් කරා ගමන් කිරීමයි.
C කාන්තාව දේශපාලනයට එක්වීමයි. D දේශපාලන න්‍යාය සහ මතවාද රටතුලට ගලා ඒම සිදුවීමයි.
E බලය සඳහා දේශපාලන ප්‍රචණ්ඩත්වය ආරම්භ වීමයි.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

32. 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණයේ මූලිකාංග අතර වූයේ,
A රාජ්‍ය මන්ත්‍රණ සභාවක් පිහිටුවීමයි. B අමාත්‍ය මණ්ඩලයක් ස්ථාපිත කිරීමයි.
C විධායක කාරක සභා 7 ක් ක්‍රියාත්මක කිරීමයි. D අගමැතිට පැවරූ බලතල සීමා කිරීමයි.
E රාජ්‍ය නිලධාරීන් තිදෙනාට වැඩි බලපෑමක් කිරීමේ අවස්ථාව ලබාදීමයි.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

33. 1931 ඩොනමෝර් ව්‍යවස්ථාව යටතේ 39 වගන්තියෙන් විධායක කාරක සභාවල කාර්යයන් ලෙස දක්වා ඇත්තේ,
A තම කාරක සභාවට පැවරී ඇති කාර්යයන් පිළිබඳ සුපරීක්ෂාකාරී වීම.
B එම කාර්යයන් භාරව කටයුතු කරන දෙපාර්තමේන්තු නිසි ආකාරයෙන් පාලනය කිරීම.
C සිය කාර්යයන් සම්බන්ධයෙන් විධායක කාරක සභා අගමැතිවරයාට වගකීම.
D අදාල දෙපාර්තමේන්තුවල කාර්ය ක්ෂේත්‍රයට අයත් ව්‍යවස්ථාදායක ප්‍රතිපත්ති තීරණය කිරීම.
E අදාල දෙපාර්තමේන්තු වල යම් යම් නිලධාරීන් පත්කිරීම පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

34. සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාල ප්‍රකාශයන් වන්නේ,
A පාර්ලිමේන්තු ස්වාධිපත්‍ය හිමි නොවීම.
B වෙස්ට් මිනිස්ටර් ආකෘතිය අනුව සිදු වූ නිර්මානයක් වීම.
C ද්වි මාණ්ඩලික ව්‍යස්ථාදායකයක් ක්‍රියාත්මක වීම.
D විධායක බලය අගමැති ඇතුළු කැබිනට් මණ්ඩලය වෙත පවරා තිබීම.
E ආණ්ඩුකරු සතුවූ බලතල සියල්ල අග්‍රාණ්ඩුකරු වෙත විතැන් කිරීම.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

www.artsapi.lk



Scanned by CamScanner

35. 1948 සෝල්බරි ආණ්ඩුක්‍රමය
A සුළු ජනකොටස් ආරක්ෂා කරන වගන්ති සහිතව ඉදිරිපත් විය.
B නාමික විධායකයක් හඳුන්වා දීමක් සිදුවිය.
C අවසන් අධිකරණ බලය බ්‍රිතාන්‍ය සතුවිය.
D රජිණ තව දුරටත් ශ්‍රී ලංකාව තුළ වලංගු දේශපාලන සාධකයක් නොවීය.
E සාමූහික වගකීමේ මූලධර්මය මත ක්‍රියාත්මක විය.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

❖ **අංක 36 සිට 40 තෙක් ප්‍රශ්න සඳහා ඒ ඒ මාතෘකාවට හා සම්බන්ධ ප්‍රකාශ පහක් ඉදිරිපත් කොට ඇත. ඉන් හතරක් සාවද්‍ය ප්‍රකාශ වන අතර එම සාවද්‍ය ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.**

36. 1972 ව්‍යවස්ථාදායකය
A හැඳින්වූයේ රාජ්‍ය මන්ත්‍රණ සභාව ලෙසය
B සමන්විත වූයේ ඡන්දයෙන් හා නාමකරණයෙන් තෝරාගන්නා ලද මන්ත්‍රීවරුන්ගෙන් පමණි.
C නිල කාලය වසර පහකට සීමාවේ.
D උත්තරීතර බලයේ හිමිකරුවා ලෙස ක්‍රියාත්මක විය.
E දෝෂාභියෝග යෝජනාවක් සම්මත කිරීමෙන් පසු අගමැතිවරයා ඉවත් කළ හැකිවේ.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

37. 1972 ව්‍යවස්ථාවට අනුව,
A ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන් ජනපති උපදෙස් මත අගමැති පත්කරයි.
B උසස් අධිකරණ ආයතනය වන්නේ ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය මහේස්ත්‍රාත් අධිකරණයන්ය.
C උපදේශාත්මක අධිකරණ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට පැවරීම දැකිය හැකිවීය.
D ස්වාධීන අධිකරණ සේවා කොමිසමේ බලතල තව දුරටත් ස්ථාවර කරනු ලැබීය.
E අධිකරණ ආයතනය පිහිටුවීමේ සම්පූර්ණ බලය ජනාධිපතිවරයා සහ අගමැතිවරයා හවුලේ භුක්ති වින්දේය.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

38. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව,
A පාර්ලිමේන්තුව නමින් ද්වි මාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් නිර්මාණය විය.
B පාර්ලිමේන්තුවේ සාමාජික සංඛ්‍යාව නිශ්චිත නොවන අතර, ජාතික ලැයිස්තුවෙන් පත්වන සංඛ්‍යාව වරින් වර වෙනස් වේ.
C වසර හතර හමාරක නිල කාලයක් සඳහා තෝරාගන්නා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත විය.
D ව්‍යවස්ථාදායක බලය පාර්ලිමේන්තුව විසින් ද ජනමත විචාරණයකදී ඍජුව ජනතාව විසින්ද ක්‍රියාත්මක කරනු ලැබේ.
E පාර්ලිමේන්තු මැතිවරණයක දී මුළු රටම එක් ඡන්ද කොට්ඨාසයක් ලෙස සලකා මැතිවරණය පැවැත්වේ.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

39. 1978 ව්‍යවස්ථාවට අනුව,
A ජනාධිපතිගේ ධූර කාලය වසර 5 කි. එය 19 වන සංශෝධනයෙන් වසර 6 ක් ලෙස දීර්ඝ කෙරිනි.
B 18 වන සංශෝධනයෙන් ධූරය දැරියහැකි වාර ගණන 02 ක් ලෙසද 19 සංශෝදනයෙන් දැරිය හැකි වාර ගණනේ සීමාව ඉවත් කිරීමට ද සිදුවිය.
C 17 වන සංශෝධනය මගින් ශ්‍රී ලංකාවට පළාත් සභා ක්‍රමය හඳුන්වා දෙන ලදී.
D පාර්ලිමේන්තුව තුනෙන් දෙකක බහුතරයකින් සම්මත කොට ශ්‍රේෂ්ඨාධිකරණය ද අනුමත කරන්නේ නම් ජනාධිපති වරයාට ගෙන එන විශ්වාස භංග යෝජනාවකින් ධූරයෙන් ඉවත්කළ හැක.
E ජනාධිපතිවරයා ලෙස අපේක්ෂකයෙකු තේරී පත්වන්නේ භාවිතාකළ වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් සියයට පනහක් ඉක්මවා ඡන්දය ලබාගත් විටය.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE



www.artsapi.lk

Scanned by CamScanner

40. 1978 ව්‍යවස්ථාවට අනුව,

A ජාතික ලැයිස්තුවෙන් මන්ත්‍රීවරු 27 දෙනෙක් තෝරාපත්කර ගන්නා ලදී.

B පාර්ලිමේන්තුවේ බහුතර විශ්වාසයක් දිනාගත් පක්ෂයේ නායකයා අගමැතිවරයා ලෙස තෝරාපත්කර ගන්නා ලදී.

C දේශපාලන විධායකය ලෙස අගමැති ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලය ක්‍රියාත්මක වෙන ලදී.

D ජනාධිපතිවරයා විසින් අගමැතිවරයා තෝරා පත්කර ගැනීමට ක්‍රියාකරන ලදී.

E මූල්‍ය පාලනය පිළිබඳ පූර්ණ බලතල ජනාධිපතිවරයා වෙත කේන්ද්‍රගත කරන ලදී.

1. ABCD  2. BCDE  3. ABDE  4. ACDE  5.ABCE

❖ **අංක 41 සිට 47 තෙක් ප්‍රශ්න සඳහා ඒ ඒ මාතෘකාව හා සම්බන්ධ ප්‍රකාශ පහක් ඉදිරිපත් කොට ඇත. ඒවායින් නිවැරදි වන්නේ ප්‍රකාශ හතරක් පමණි. නිවැරදි ප්‍රකාශ අන්තර්ගත කාණ්ඩය තෝරන්න.**

41. 1978 ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයාට එරෙහිව ඉදිරිපත් වන දෝෂාභියෝග යෝජනාවක් සඳහා අදාල චෝදනා විය යුත්තේ,

A මහ බැංකු මූල්‍ය වංචා සිදුකිරීම.

B මානසික හෝ ශාරීරික ආබාධයකින් පෙළීම

C චරිත දූෂණය

D රාජ්‍ය ද්‍රෝහි වීම

E අල්ලස් හෝ වෙනත් දූෂණ චෝදනා වලට ලක්වීම.

1. ABCD  2. BCDE  3. ABDE  4. ACDE  5.ABCE

42. පළාත් සභා,

A පළාතට එකක් වන ලෙස පිහිටුවා ඇත.

B 1987 අංක 42 දරණ පනතට අදාලව පිහිටුවීමට පියවරගෙන ඇත.

C ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකළ 13 වන සංශෝදනයට අනුව ක්‍රියාත්මක විය.

D පිහිටුවීමට මුල් වූ කරුණක් ලෙස උතුරු නැගෙනහිර ජනවාර්ගික අර්බුදය දැක්විය හැකිය.

E උතුරේ ක්‍රියාත්මක වූ LTTE සංවිධානයේ ප්‍රබල ඉල්ලීම මත මෙය ලබාදුනි.

1. ABCD  2. BCDE  3. ABDE  4. ACDE  5.ABCE

43. පළාත් ආණ්ඩුකාරවරයා

A ජනාධිපති විසින් තෝරා පත්කරනු ලබයි.

B පළාත් සභාවේ නාමික විධායකය ලෙස කටයුතු කරයි.

C ප්‍රධාන විධායක බලතල හා මූල්‍ය බලතල හිමිකරගනියි.

D මහ ඇමතිගේ නාමයෙන් ක්‍රියාත්මක වෙයි.

E පළාත් මහඇමතිවරයා පත් කිරීමට දායක වෙයි.

1. ABCD  2. BCDE  3. ABDE  4. ACDE  5.ABCE

44. ශ්‍රී ලංකාවේ පක්ෂ ක්‍රමයට අදාලව,

A 1935 ලංකා සම සමාජ පක්ෂය මුල්ම පක්ෂය ලෙස ආරම්භ විය.

B වාමාංශික පක්ෂ ක්‍රමයෙන් බෙදීයාමත් බලයෙන් අඩුවීමත් සිදුවිය.

C සමානුපාතික නියෝජනය හරහා බහු පක්ෂ රටාවක් නිර්මාණය විය.

D ජාතිවාදී පක්ෂ ක්‍රමයෙන් පක්ෂ භූමිකාවෙන් ඉවත් විය.

E ප්‍රධාන පක්ෂ දෙකක් වටා බලය හුවමාරුවීම සිදුවීමේ ඉතිහාසයක් දැකිය හැකිවීම.

1. ABCD  2. BCDE  3. ABDE  4. ACDE  5.ABCE

45. 1978 ව්‍යවස්ථාවට එක්වූ 19 වන ව්‍යවස්ථා සංශෝධනය අනුව,

A අමාත්‍ය මණ්ඩලයේ මුළු සංඛ්‍යාව 30 නොඉක්මවිය යුතුවිය.

B ජනාධිපති ධූරය සඳහා ඉල්ලුම් කිරීමේ වයස් සීමාව අවු 30 ට අඩු කරන ලදී.

C පාර්ලිමේන්තුව පත්ව වසර හතර හමාරක් ගතවන තුරු ජනාධිපතිවරයාට එය විසුරුවා හැරිය නොහැකිවිය.

D නියෝජ්‍ය ඇමතිවරු සහ අමාත්‍ය මණ්ඩල නොවන ඇමතිවරුන්ගේ සංඛ්‍යාව 40 නොඉක්ම විය යුතුය.

E නිල කරුණු සම්බන්ධයෙන් ජනාධිපතිවරයාව අධිකරණයට කැඳවීමේ අයිතිය පුරවැසියන්ට හිමිවේ.

1. ABCD  2. BCDE  3. ABDE  4. ACDE  5.ABCE

www.artsapi.lk



Scanned by CamScanner

46. වර්තමානයේ අධිකරණයේ ස්වාධීනත්වය සඳහා ගෙන ඇති ව්‍යවස්ථානුකූල ක්‍රියාමාර්ග වන්නේ,

A ජනාධිපතිවරයාගේ අත්සනින් ව්‍යවස්ථා සභාවේ අනුමැතිය සහිතව ශ්‍රේෂ්ඨාධිකරණ සහ අභියාචනාධිකරණ විනිසුරුවරයන් පත්කළ හැකි වුවත් ඉවත් කිරීම කළ නොහැක.

B විනිසුරුවන්ගේ වැටුප් ගෙවීම රජයේ ඒකාබද්ධ අරමුදල මගින් සිදු කිරීම.

C කිසිවෙකුට අධිකරණයට අභියෝග කිරීම හෝ අපහාස කිරීම කළ නොහැකි වීම.

D කිසිදු ඉහළ උසාවි විනිසුරුවරයෙකුට වෙනත් තනතුරක්, නිලයක්, දැරීම හෝ ඒ යටතේ වෘත්තියක යෙදීම තහනම් වේ.

E ශ්‍රේෂ්ඨාධිකරණයේ ක්‍රියාකාරීත්වය පිළිබඳව පුරවැසියෙකුට ගැටලුවක් ඇත්නම් ප්‍රිවි කවුන්සිලය හරහා යුක්තිය ඉල්ලා සිටිය හැක.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

47. සාර්ක් සංවිධානයට අදාලව,

A ආසියානු කලාපයට අයත් රටවල් එක්ව ආර්ථික සහයෝගීතාවය සඳහා පිහිටුවාගෙන ඇත.

B 1984 දෙසැම්බර් 08 දින ඩකා අගනුවරදී පිහිටුවාගන්නා ලදී.

C මේ වන විට එහි සාමාජික රටවල් සංඛ්‍යාව 08 කි.

D සාර්ක් සංවිධානයේ ලේකම් කාර්යාලය නේපාලයේ කත්මන්ඩු නුවර පිහිටා ඇත.

E දකුණු ආසියානු වරණාත්මක සහ නිදහස් වෙළඳ ගිවිසුම් දෙක (SAPTA – SAFTA) සාර්ක් සංවිධානයේ රටවල් අතර ඇතිකරගත් වැදගත් ගිවිසුම් දෙකකි.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

❖ **පහතින් දැක්වෙන ප්‍රකාශ පදනම් කරගෙන අංක 48 සිට 49 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - ලෝක සාමය සහ ආරක්ෂාව පවත්වා ගෙන යාමේ අරමුණ.

B - යටත් විජිත ලෙස පැවති රාජ්‍ය අතර සහයෝගය තව දුරටත් රඳවා ගැනීම.

C - එයට අයත් සියලුම සාමාජිකයන්ගෙන් මහා මණ්ඩලය සමන්විත වේ.

D - ආරක්ෂක මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාව 15 ක් වීම.

E - 1944 දී පිහිටුවා ගනු ලැබුණි.

F - නායකයා බවට පත්වන්නේ රජු හෝ රැජිනයි.

G - 1967 ඉන්දුනීසියාවේ ජාකර්තා නුවරදී ආරම්භ විය.

H - සෑම රාජ්‍යක්ම පාහේ යටත් විජිත ලෙස පැවත නිදහස ලැබූ රාජ්‍යයන්ය.

I - ආරම්භය සඳහා ඍජුව බලපෑ වාර්තාව වූයේ 1839 ඩර්හැම් වාර්තාවයි.

J - විනිශ්චයකරුවන් 15 ක ගෙන් සමන්විත ජාත්‍යන්තර අධිකරණය මෙහි ප්‍රධානම අධිකරණයයි.

48. ඉහත ප්‍රකාශ වලින් එක්සත් ජාතීන්ගේ සංවිධානයට අදාල ප්‍රකාශ ඇතුලත් කාණ්ඩය තෝරන්න.

1. ABDJ 2. ACDJ 3. BCDH 4. AEGJ 5. ACEH

49. ඉහත ප්‍රකාශ වලින් පොදු රාජ්‍ය මණ්ඩලයට අයත් ප්‍රකාශ ඇතුලත් කාණ්ඩය තෝරන්න.

1. ABEG 2. BCDJ 3. BEHI 4. ABCD 5. ADEJ

50. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන වලට අදාලව නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

A ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතනය වන්නේ මහනගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා වේ.

B එය තම ප්‍රදේශය තුළ පොදු මංමාවත්, මහජන සෞඛ්‍යය, පොදු උපයෝගිතා සේවා පවත්වාගෙන යා යුතුය.

C 1987 ඉන්දු ලංකා සාම ගිවිසුම යටතේ පිහිටුවන ලදී.

D පළාත් සභාවල අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.

E 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත මගින් පිහිටුවා ඇත.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

www.artsapi.lk



Scanned by CamScanner

**දේශපාලන විද්‍යාව**

**තෙවන වාර පරීක්ෂණය - 2018**

**13 ශ්‍රේණිය - II කොටස**

- **B හා C කොටස් වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරා ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු ලියන්න.**

## B කොටස

01. පහත මාතෘකා දෙකෙන් එකක් සාකච්ඡා කරන්න.
    1. ඔබ දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය විග්‍රහ කරන්නේ කෙසේදැයි පැහැදිලිකරන්න.
    2. දේශපාලන විද්‍යාව සමාජ විද්‍යාවකි. යන්න පිළිබඳව විමසුමක යෙදෙන්න. (10 x 2 = 20)

02. පහත දැක්වෙන මාතෘකා වලින් දෙකක් පිළිබඳව අදහස් දක්වන්න
    1. නූතන ආණ්ඩුක්‍රම තුළ ජනාධිපති විධායකයන් පැවතීමේ වාසි අවාසි ✓
    2. මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ක්‍රමවේදයන්
    3. ස්වාධිපත්‍ය පිළිබඳ න්‍යායේ වර්තමාන ප්‍රායෝගික බව පිළිබඳ විමසුමක්
    4. මිනිසුන් දේශපාලනය ඉගෙන ගන්නා ආකාරයන් ✓ (10 x 2 = 20)

03. පහත මාතෘකා වලින් දෙකක් විභාග කරන්න.
    1. ජාතික ආණ්ඩු - සභාග ආණ්ඩු සන්ධාන ආණ්ඩු අතර වෙනස්කම්.
    2. යහ පාලනය
    3. නව රාජ්‍යයක සිවිල් සමාජයේ භූමිකාව
    4. දේශපාලන සංස්කෘතිය (10 x 2 = 20)

04. පහත සඳහන් මාතෘකා වලින් දෙකකට පිළිතුරු සපයන්න.
    1. බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව සහ රජිණ අතර ඇති ව්‍යවස්ථාදායක සබඳතා
    2. ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරයා ඉවත් කිරීමේ දෝෂාභියෝග ක්‍රියාවලිය
    3. ස්විට්සර්ලන්ත ආණ්ඩුක්‍රමයේ සාමූහික විධායකය
    4. ප්‍රංශ ජනාධිපතිරවයා සතු විධායක හා ව්‍යවස්ථාදායක බලතල හා කාර්යයන් (10 x 2 = 20)

## C කොටස

05. පහත මාතෘකා දෙකෙන් ඕනෑම එකක් පිළිබඳ විමසීමක යෙදෙන්න.
    1. ලංකාව නව දේශපාලන, ආර්ථික සමාජ රටාවකට ගෙන ගියේ 1833 කෝල්බෲක් කැමරන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මගිනි. ඔබේ පිළිතුරට අදහස් දක්වන්න. ✓
    2. ලංකා වාමාංශික ව්‍යාපාරය හෝ ලංකා ජාතික ව්‍යාපාරයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ විමසුමක යෙදෙන්න. (10 x 2 = 20)

06. පහත දැක්වෙන මාතෘකා වලින් එකකට විවේචනාත්මක රචනයක් ලියන්න.
    1. 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණයෙන් ලැබුණු සර්වජන ඡන්ද බලය නිසා රට තුළ ඇතිවූ වෙනස්කම්. ✓
    2. 1978 හා 1972 ව්‍යවස්ථාදායක ක්‍රියාකාරිත්වය. ✓
    3. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ජනාධිපතිවරයාගේ ධූරය සම්බන්ධයෙන් සිදුකළ වෙනස්කම්
    4. 1978 ව්‍යවස්ථාව මගින් හඳුන්වා දුන් ජනාධිපතිවරයා ඉවත් කිරීමේ නෛතික ක්‍රියාවලිය (10 x 2 = 20)

07. පහත සඳහන් මාතෘකා වලින් දෙකට පිළිතුරු ලියන්න.
    1. අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකාවේ ඇති නීතිමය විධිවිධාන
    2. ප්‍රාදේශීය සභා සහ කොට්ඨාස පදනම් කරගත් ඡන්ද ක්‍රමය.
    3. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ කැඩී බෙදීයාමේ වර්තමාන නැඹුරුව
    4. 1978 ව්‍යවස්ථාවෙන් හඳුන්වා දුන් මැතිවරණ ක්‍රමයෙන් ආගමික, ජාතිවාදී දේශපාලන පක්ෂ බිහිවීමේ නැඹුරුව (10 x 2 = 20)

08. පහත සඳහන් මාතෘකා වලින් දෙකක් පිළිබඳ අදහස් දක්වන්න.
    1. ශ්‍රී ලංකාව සහ අන්තර් ජාතික මානව හිමිකම් කොමිසම
    2. පොදු රාජ්‍ය මණ්ඩලය හා ශ්‍රී ලංකාව
    3. දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංවිධානය (SAARC)
    4. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහා මණ්ඩලයේ කාර්ය භාරය (10 x 2 = 20)



www.artsapi.lk

Scanned by CamScanner